පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEADQUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 517

දුරකථනය / தொலைபேசி / Telephone +94 (0) 11 24 21 750, +94 (0) 11 24 21 111 - 9

ෆැක්ස් / தொலைநகல் / Fax +94(0) 11 24 46 174, +94(0) 11 24 40 440

ඊ-මේල් / மின் அஞ்சல் / E-mail igp@police.lk, telligp@police.lk

website: www.police.lk


මගේ අංකය / எனது இல. / My No. STAFFDIG/IG/OUT/05/2489/2020

ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 2020.03.18

## පොලිස් ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කිරීම

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ නාමයෝජනා ඉදිරිපත් කිරීමේ කටයුතු බාධාවකින් තොරව සිදු කිරීම සඳහා 2020.03.18 වන දින පහත සඳහන් පොලිස් බලප්‍රදේශ සඳහා පැනවූ පොලිස් ඇඳිරි නීතිය 2020.03.19 වන දින පෙරවරු 0800 ට තාවකාලිකව ඉවත් කර නැවත පස්වරු 0200 සිට නැවත දැනුම්දෙන තුරු ක්‍රියාත්මක කරනු ලැබේ.

1. **පුත්තලම පොලිස් අධිකාරි බලප්‍රදේශය**
   (මුන්දලම, කල්පිටිය, වනාතවිල්ලුව, ආණමඩුව, පුත්තලම, සාලියවැව, පල්ලම, නවගත්තේගම, කරුවලගස්වැව, නොරච්චෝලේ, උඩප්පුව යන පොලිස් බලප්‍රදේශ ඇතුළත් වේ.)

2. **හලාවත පොලිස් අධිකාරි බලප්‍රදේශය**
   (වෙන්නප්පුව, කොස්වත්ත, මාරවිල, හලාවත, මාදම්පේ, ආරච්චිකට්ටුව, දංකොටුව යන පොලිස් බලප්‍රදේශ ඇතුළත් වේ.)

3. **මීගමුව පොලිස් අධිකාරි බලප්‍රදේශයේ කොච්චිකඩේ පොලිස් වසම**

ඇඳිරි නීති කාලය තුළ දී සියලු ම තැනැත්තන් තම නිවෙස්වල රැඳී සිටිය යුතුය. එසේ ම, ඇඳිරි නීතිය ඉවත් කර ඇති කාලසීමාව තුළ ද තම ගමන්බිමන් උපරිම වශයෙන් සීමා කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන කාලය තුළ එම බලප්‍රදේශ හරහා ගමන් කරන පොදු මගී සේවා වාහන සහ අත්‍යවශ්‍ය සේවා සඳහා පමණක් අවසර දෙනු ලැබේ.

කටුනායක ගුවන් තොටුපල වෙත ගමන් ගන්නා ගුවන් මගීන් සඳහා ගුවන් ටිකට්පත ඇඳිරි නීති බලපත්‍රයක් වශයෙන් භාවිත කළ හැකිය.

සී.ඩී. වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති